# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/ER/WE/Circular/ 2021 | ඔබේ අංකය / உமது இல / Your No: ............................................ | දිනය / திகதி / Date: 2021.02.22 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2021/06**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම මූලස්ථාන, කලාප, ව්‍යාපෘති කළමණාකරුවන් හා බැංකු සමිති කළමණාකරුවන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කර**
**ගෘහස්ථ අලෙවි සැල් ස්ථාපිත කිරීමේ වැඩසටහන**

2021 වර්ෂයේ අයවැය යෝජනා අනුව දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ අරමුණ පෙරදැරිව ලාංකීය වෙළඳ ජාලය ශක්තිමත් කිරීම සඳහා සමෘද්ධි / අඩුආදායම්ලාභී පවුල් වලින් තෝරා ගත් තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කර ගනිමින් සෑම ග්‍රාම නිලධාරි වසමකම ගෘහස්ථ අලෙවිසැල් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙම අලෙවි සැල් ජාලය ආර්ථික පුනර්ජීවණය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ නියමයන් මත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසකගේ දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර මෙමඟින් අත්‍යාවශ්‍ය සේවාවන් රැසක් පාරිභෝගිකයන් හට සපයාදීමට අපේක්ෂිතය.

**ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු**

i. සෑම ග්‍රාම නිලධාරී වසමකින්ම සමෘද්ධි සහනාධාරලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල් වලින් තෝරාගත් තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් සවිබල ගැන්වීම.
ii. දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
iii. ගමේ නිෂ්පාදන සඳහා අඛණ්ඩ වෙළඳපොලක් නිර්මාණය කිරීම.
iv. නිෂ්පාදන සඳහා ප්‍රශස්ථ මිලක් ලබාදීම.
v. ප්‍රදේශයේ පවතින ඉල්ලුමට අනුව නිෂ්පාදන දිරිගැන්වීම.
vi. පරිභෝජනයට අවශ්‍ය සියළුම භාණ්ඩ ගමේ අලෙවිසැලෙන් සහන මිලට ලබා ගැනීමේ හැකියාව.
vii. නිවසේ සාමාන්‍ය දෛනික කටයුතු කරන අතරම අලෙවිසැල පවත්වා ගෙන යාමේ පහසුකම් ඇති කිරීම.
viii. විවිධ ආයතන වල නිෂ්පාදන හා සේවාවන් සඳහා වෙළඳපොල සකසා දීම.
ix. සෘජු හා වක්‍ර රැකියා අවස්ථාවන් ඇති කිරීම.
x. වසංගත රෝග, අවදානම් සහ ආපදා තත්ත්වයන්හිදී පාරිභෝගික ජනතාවට ආහාර ඇතුළුව අත්‍යාවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය හා සේවා සැපයීම සඳහා විධිමත් වෙළඳ ඒකක ජාලයක් ස්ථාපිත කිරීම.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**ව්‍යවසායකයින් තෝරා ගැනීම**

කාන්තා ව්‍යවසායකයින් තෝරා ගැනීමේ දී භාවිතා කළ යුතු අයදුම් පත්‍රය සහ එය සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් ***ඇමුණුම් අංක 01 හා 02*** මඟින් දක්වා ඇත.

**පහත සඳහන් මූලික සුදුසුකම් සහිත අයවළුන් ගෙන් පමණක් තෝරාගැනීම සිදු කළ යුතුවේ.**

- සමෘද්ධි සහනාධාරලාභි / අඩුආදායම්ලාභි තරුණ කාන්තාවක් වීම.
- සින්නක්කර ඉඩමක් හෝ පිළිගත හැකි ඉඩම් බලපත්‍රයක් හිමි ස්ථිර පදිංචිකරුවෙකු වීම.
- අලෙවි සැලකට සුදුසු ස්ථානයක් වීම හා ස්ථිර නිවසක් නොමැති අයෙකු වීම විශේෂ සුදුසුකමකි.
- ග්‍රාම නිලධාරී වසමේ නිෂ්පාදකයින්ගේ භාණ්ඩ අලෙවි කිරීමට ද එකඟවීම.
- එළඹෙන ගිවිසුමේ වගකීම් සම්පූර්ණ කිරීමට එකඟ වන අයෙකුවීම

**ව්‍යාපෘති සඳහා පවුල් තෝරා ගැනීමේ ග්‍රාමීය කමිටු සංයුතිය**

1. ප්‍රදේශයේ විහාරස්ථානවල විහාරාධිපති ස්වාමින් වහන්සේලාඹ අනෙකුත් ආගමික පූජකතුමන්ලා
2. පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්
3. සමෘද්ධි සංවර්ධන නිලධාරි
4. ආර්ථික සංවර්ධන නිලධාරි
5. ග්‍රාම නිලධාරි
6. කෘෂිකර්ම සංවර්ධන පර්යේෂණ නිලධාරි
7. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි
8. ප්‍රජා සංවිධාන නායකයින්

i. ඉහත ග්‍රාමීය කමිටුව විසින් තෝරාගත් සුදුසුම තරුණ කාන්තා ව්‍යවසායකයින් ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කල යුතුය.

   මෙහිදි ග්‍රාමිය කමිටුවේ සම්බන්ධිකරණය, සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් කල යුතුවේ.

ii. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් ග්‍රාම නිලධාරි වසමකට **දෙදෙනෙකු** වන පරිදි සුදුසුම කාන්තා ව්‍යවසායකයින් තෝරා අනුමැතිය ලබා දීමට කටයුතු කල යුතුවේ.

   මෙහිදි ප්‍රාදේශිය සම්බන්ධීකරණ ජීවනෝපාය අනුකමිටුවේ හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය ව්‍යාපෘති විෂයභාර හා මූලස්ථාන කළමණාකරු විසින් ඉටු කල යුතුය

iii. ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු නිර්දේශය ලැබූ වසම් මට්ටමින් සකස් කල කාන්තා ව්‍යවසායක අනුමත ලැයිස්තුව දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවට යොමු කොට අනුමැතිය ලබා ගැනීම අනතුරුව සිදු කල යුතුවේ.

   දිස්ත්‍රික් සම්බන්ධිකරණ ජීවනෝපාය අනුකමිටුවේ හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ විසින් කල යුතුය.

iv. මේ සම්බන්ධයෙන් වන අත්‍යාවශ්‍යම ව්‍යාපෘති අභියාචනා වේ නම් ඒ සඳහා වන ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන්නේ නම් මැනවි.

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම හා සහාය සේවා සම්බන්ධීකරණය**

i. රේඛිය අමාත්‍යාංශ වල සහාය සේවා මත කඩිනමින් ව්‍යාපෘතිය ආරම්භ කළ යුතුය.

ii. හඳුනාගනු ලබන ව්‍යවසායකයින්ට වෙළඳ හා මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳව මෙන්ම අදාල අනෙකුත් පුහුණුවීම් හා යෙදවුම් ලබා දීමත් වෙළඳසැල් ඉදිකිරිමත් පහත සඳහන් අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් සිදුකිරිමට සැලසුම් සකස් කර ඇත. මෙහිදි පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගි නොවන ප්‍රතිලාභින් මෙම වැඩසටහනට ඇතුලත් නොවනු ඇත.

   1. මුදල් අමාත්‍යාංශය
   2. පළාත් පාලන අමාත්‍යාංශය
   3. මහා මාර්ග අමාත්‍යාංශ

4. වෙළඳ අමාත්‍යාංශය
5. නිවාස අමාත්‍යාංශය
6. තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය
7. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
8. කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන , පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
9. ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
10. සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික සේවා රාජ්‍ය අමාත්‍යාංශය
11. ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය
12. රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාව
13. තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය
14. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
15. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
16. කාන්තා කාර්යාංශය

iii. ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ව්‍යවසායක කාන්තාව සමඟ ගිවිසුම් ගත වීම අනිවාර්යය වන අතර එම ගිවිසුම ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

iv. යෝජිත අලෙවිසැල් වල ඉදිරිපස පෙනුම හා සැලැස්ම එකම ආකාරයෙන් මෙම වැඩසටහනේ අනන්‍යතාවය තහවුරු වන අයුරින් ඉදිකිරීමත්, ග්‍රාමීය, අර්ධ නාගරික හා නාගරික ප්‍රදේශයන්ට ගැලපෙන අයුරින් ඉඩ ප්‍රමාණයන් 03 කින් නිම කිරීමටත් සැලසුම් කර ඇත.

v. අලෙවිසැලේ නම හා ලාංඡනය ඉදිරියේදී ලබාදීමට නියමිතය.

vi. නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් නිවාසය සහිතව මෙම අලෙවි සැල ඉදිකිරීමේ කටයුතු සිදු කරනු ඇත.

vii. අලෙවිසලෙහි භාණ්ඩ තැබීමට හා ප්‍රදර්ශණය කිරිමට අවශ්‍ය උපකරණ , ශීතකරණ පහසුකම් සැපයීමට සැලසුම් සකස්කර ඇත.

viii. අලෙවිසලට අවශ්‍ය අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ අලෙවිසලට නිරන්තර සැපයීමේ ජාලය සතොස හා සමූපකාරය මගින් සිදු කරනු ඇත.

v. ව්‍යාපෘතිය සාර්ථක කර ගැනිම සඳහා අවශ්‍ය පහසුකරණය සහ පසුවිපරම වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් සිදුකල යුතුය.

vi. බැංකු කලාප භාර කළමණාකරු කලාපයේ මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබා දීම සහ කලාපයේ වසම් වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම සිදුකල යුතු අතර අවශ්‍ය අවස්ථා හඳුනාගෙන පහසුකරණය හා වාර්තා කිරීම සිදුකල යුතුය.

vii. ව්‍යාපෘති විෂය භාර කළමනාකරු හා මූලස්ථාන කළමණාකරු විසින් කොට්ඨාශයේ සමස්ත වැඩ සටහන සම්බන්ධිකරණය, පහසුකරණය, මග පෙන්වීම අවශ්‍ය අවස්ථා වල මැදිහත්වීම හා ප්‍රගතිය වාර්තා කිරීම සිදුකල යුතුය.

**අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයීම**

i. ඉහත සඳහන් ග්‍රාමීය කමිටුව විසින් වසමේ ක්‍රියාත්මක වන ගෘහස්ථ අලෙවි සැල් පිළිබඳව නිරන්තර අවධානය යොමු කළ යුතු මෙන්ම මසකට දෙවරක් රැස්වී සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් කරමින් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක වන බවට වග බලා ගත යුතුය.

ii. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමණාකරු ,ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරු යන නිලධාරීන්, ග්‍රාමීය කමිටුව මසකට වරක් රැස්වී කොට්ඨාශයේ මෙම අලෙවි ව්‍යාපෘතිය සාර්ථකව නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරීම, ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනීම හා යාවත්කාලීන කිරීම කළ යුතුවේ.

iii. ව්‍යාපෘති හා මුලස්ථාන කළමණාකරු, කාන්තා හා ළමා සංවර්ධන නිලධාරි, තරුණ කටයුතු නිලධාරි හා කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි මසකට දෙවරක් රැස්වී ව්‍යාපෘතියේ ප්‍රගතිය සාකච්ඡා කලයුතු අතර ගෘහස්ථ අලෙවි සැල් ඉදිකිරිමේ සිට ඉදිරි කටයුතු පරික්ෂා කර බැලීම කළයුතුය.

iv. ඉහත නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්ගේ නිරන්තර අධික්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ.

v. මෙහිදී ප්‍රජා මූල සංවිධාන ද මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.

vi. ඉදිරියේදී ඔබ වෙත හඳුන්වා දෙන Samurdhi app එක හරහා ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරිමටත් යාවත්කාලින කිරිමටත් කටයුතු කළ යුතු වේ.

vii. ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම කෙරෙහි දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් නිරන්තර අවධානය යොමු කළ යුතුවේ.

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ උපදෙස් මත 2021 මාර්තු 02 දින සිට මාර්තු 08 දින දක්වා ක්‍රියාත්මක සෞභාග්‍යා සතිය තුළ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස්කර ගැනීමට කටයුතු කල යුතුවේ.

මෙම ගෘහස්ථ අලෙවිසැල් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා ඔබ ඇතුළු සමෘද්ධි නිලධාරින්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 මඟින් හෝ divinegumalh@yahoo.com /jeevonopaya@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයන් මඟින් ජීවනෝපාය සංවර්ධන අංශය අමතන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. සභාපති, ජාතික සම්බන්ධිකරන ජීවනෝපාය අනු කමිටුව, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරිම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.ස.
2. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.ස.
3. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.ස.
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
5. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරිම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.ස.
6. ලේකම්, පළාත්පාලන අමාත්‍යාංශය
7. ලේකම්, මහා මාර්ග අමාත්‍යාංශය
8. ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
9. ලේකම්, නිවාස අමාත්‍යාංශය
10. ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
11. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
12. ලේකම්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන , පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
13. ලේකම්, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
14. ලේකම්, සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික සේවා රාජ්‍ය අමාත්‍යාංශය
15. සභාපති, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය
16. සභාපති, රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාව
17. සභාපති, තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය
18. අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
19. අධ්‍යක්ෂ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
20. අධ්‍යක්ෂ, කාන්තා කාර්යංශය
21. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
22. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
23. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

(6 – 23) කා.දැ.ගැ.ස / අ.ක.ස

**සමෘද්ධි සහනාධාරලාභී තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කර සෑම ග්‍රාම නිලධාරී වසමකම අලෙවි ස්ථාපිත කිරීමේ වැඩසටහන**

ප්‍රතිලාභී අයදුම් පත්‍රය *(1 කොටස අදාල ප්‍රතිලාභියා විසින් පිරවිය යුතුය)*

**සින්නක්කර හෝ පිළිගත හැකි බලපත්‍රයක් සහිත අවම වශයෙන් පර්චස් 06 ක ඉඩමක් හිමි, ස්ථිර පදිංචිය සහිත හා තම ග්‍රාම නිලධාරී වසමේ නිෂ්පාදකයන්ගේ භාණ්ඩ අලෙවි කිරීමට කැමති හා මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණු වැඩමුළු සඳහා සහභාගිවීමට එකඟතාව පලකරණ සමෘද්ධි / අඩුආදායම්ලාභී කාන්තාවන්ගෙන් පමණක් මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය**

**1 කොටස**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-

   ..............................................................................................................................................

2. ලිපිනය:- ..............................................................................................................................

   ..............................................................................................................................................

3. දිස්ත්‍රික්කය:-............................................................ ...................................................................

4. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය:-....................................... ග්‍රාම නිලධාරි වසම:- ..........................................

5. දූරකතන අංකය:-.......................................................................................................................

6. සමෘද්ධිලාභි /අඩුආදායම්ලාභි යන වග :-.......................................................................................

7. උපන් දිනය :-..........................................................................................................................

8. වයස: ....................................................................................................................................

9. ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම:-.............................................................................................

10. පවුලේ සමාජික සංඛ්‍යාව :- ...........................................................................................................

11. වසමේ ස්ථිර පදිංචි කරුවෙක්ද යන වග :-.........................................................................................

    ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

................................ ..................................

අයදුම්කරුගේ අත්සන දිනය

---

ග්‍රාමීය කමිටු නියෝජිතයින්ගේ නිර්දේශය :-

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

# ගිවිසුමයි

මෙහි මින්මතු පළමු පාර්ශවය යනුවෙන් සඳහන් කෙරෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ 4වන මහළ, සෙත්සිරිපාය (1 අදියර), බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන්, ..................................... දිස්ත්‍රික්කයේ ....................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් ..................................................... යන අය ( එකී **ප්‍රාදේශීය ලේකම්** සහ බලය පැවරෙන්නන් ද) පළමු පාර්ශවයට ද,

.................... දිස්ත්‍රික්කයේ ....................................................................... යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක .................................... දරණ **....................................................................** (එකී **..........................................** සහ එම අයගේ උරුමක්කාර පොල්මඃකාර අද්මිනිස්ත්‍රාසිකාර ලැබුම්කාරයින් ද) දෙවන පාර්ශවයට ද බැඳී එකී දෙපාර්ශවය අතර වර්ෂ 2021 ක් වූ ..................... (.....) මස .............. වන දින පහත සඳහන් පොරොන්දු ගිවිසිලි වලට යටත්ව මෙම ගිවිසුමට එළඹෙන ලදී.

**ඒ අනුව සියල්ලෝම දැනගත යුතු වග නම් :-**

### 01. නියෝජනය කිරීම් සහ වගකීම්

1. මෙම ගිවිසුමට එළඹීමට සහ මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් නිසි පරිදි ඉටුකිරීමට තමන්ට සම්පූර්ණ අයිතිය, බලය, හැකියාව සහ අධිකාරිය ඇති බවට එක් එක් පාර්ශව කරුවන් විසින් අනෙක් පාර්ශව වෙත වගකියනු ලැබේ.

2. මෙම ගිවිසුම සඳහා එළඹීමට අවශ්‍ය කරන සෑම සියළු තොරතුරක්ම සහ කරුණක්ම පාර්ශවකරුවන් විසින් ලබාදෙනු ලැබේ.

3. මෙම ගිවිසුම සම්පූර්ණ වශයෙන්ම පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර පවතින ගිවිසුමක් වන අතර මෙම ගිවිසුම යටතේ තමන්ට පැවරෙන යුතුකම්, වගකීම් සහ බැඳීම් තෙවන පාර්ශවයක් වෙත පැවරිය නොහැක.

### 02. ගිවිසුම් කාලය :

මෙම ගිවිසුම වර්ෂ දෙදහස් විස්එක (2021) ක් වූ .................... මස ............ වන දිනෙන් ආරම්භ වී වර්ෂ දෙදහස් තිස් එකක් වූ (2031) වූ ............... මස .............. දින දක්වා වූ වසර දහයක කාලයක් සඳහා වලංගු වේ.

### 03. පළමු පාර්ශවයේ හිමිකම් සහ බැඳීම් :

3.1 පළමු පාර්ශවය වන **...............................** **ප්‍රාදේශීය ලේකම්** විසින් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, නිවාස අමාත්‍යාංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය, මහා මාර්ග අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ 2021 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහනක් වන " සමෘද්ධි පවුල්වලින් තෝරාගත් තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000ක් ඉලක්ක කර ගෙන වෙළඳ ජාලය ශක්තිමත් කිරීම සඳහා සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකම ගෘහස්ථ අලෙවි සැල් ස්ථාපිත කිරීමේ " වැඩසටහන යටතේ දෙවන පාර්ශවය වෙත බලය හා අනුග්‍රහය ලබාදීම මෙමගින් සිදුකරනු ලැබේ.

3.2 පළමු පාර්ශවය විසින් ඉහත කී අමාත්‍යාංශ හා ආයතන වල මාර්ගෝපදේශයන්ට යටත්ව රජය විසින් ලබාදෙන ගෘහස්ථ අලෙවිසැලේ අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යයන් සිදුකරනු ලැබේ.

3.3 පළමු පාර්ශවය විසින්, රජය විසින් අනුමත කර ලබාදෙන ලද උපදෙස් පරිදි මෙම අලෙවිසැල පවත්වාගෙන යාම දෙවන පාර්ශවය විසින් සිදුකරන්නේ ද යන්න නිරන්තර අධීක්ෂණය කිරීම සඳහා බලය පවතින අතර ඒ සඳහා පළමු පාර්ශවය විසින් සුදුසු නිලධාරියෙකු/නිලධාරීන් වෙත බලය පවරා එම අධීක්ෂණ කටයුතු සිදුකරනු ලැබේ.

3.4 රජය විසින්, දෙවන පාර්ශවය වෙත ගෘහස්ථ අලෙවිසැල ලබා දීමෙන් පසු එම පාර්ශවය විසින් එකී අලෙවි සැල නිසි පරිදි රජයේ උපදෙස්වලට අනුකූලව පවත්වාගෙන යාම සඳහා දෙවන පාර්ශවය කටයුතු නොකරන්නේ නම්

අලෙවි සැල සඳහා රජය විසින් වැයකරන ලද සම්පූර්ණ මුදල 10% ක වාර්ෂික පොළියක් යටතේ රජයෙන් ලබාදෙන ලද ණයක් ලෙස සලකා ආපසු අයකර ගැනීමට පූර්ණ බලය පළමු පාර්ශවය වෙත පවතී.

3.5 පළමු පාර්ශවය විසින් මෙම නව ගෘහස්ථ අලෙවිසැලෙහි විකිණීම සඳහා ලබාදීමට රජය විසින් නියමකර ඇති පරිදි සතොස හා සමූපකාර වෙළඳසල් මගින් අවශ්‍ය භාණ්ඩ තොග හිඟයක් නොමැතිව ලබාදීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකිරීමත් සමෘද්ධිලාභී/ අඩු ආදායම්ලාභී නිෂ්පාදකයන්ගේ හා ගොවියන්ගේ නිෂ්පාදන මෙම අලෙවි සැල් මගින් අලෙවි කිරීම සඳහාත් නිසි වැඩපිළිවෙලක් එකී ආයතන, රාජ්‍ය නිලධාරීන් හා සමෘද්ධි ප්‍රජාමූල සමිති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වාගෙනයාමත් සිදුකළ යුතුය.

**04. දෙවන පාර්ශවයේ හිමිකම් සහ බැඳීම් :**

4.1 රජය විසින් දෙවන පාර්ශවය වෙත ලබාදෙන ගෘහස්ථ වෙළඳසැල රජයේ උපදෙස් හා නියමයන්ට අනුකූලව නිසි පරිදි පවත්වාගෙන යාමට දෙවන පාර්ශවය බැඳී සිටී.

4.2 දෙවන පාර්ශවය විසින් තමන්ට හිමිකම පවතින බවට ඉදිරිපත් කරන ලද ඉඩම් කොටස සම්බන්ධයෙන් යම්කිසි ගැටළුවක් හෝ නීත්‍යාණුකූල අවහිරයක් ඇතිවුවහොත් එහි සම්පූර්ණ වගකීම දෙවන පාර්ශවය විසින් ගන්නා බවටත්, එබඳු හේතුවක් මත හෝ දෙවන පාර්ශවයේ අකාර්යක්ෂමතාව මත හෝ වෙනත් හේතුවක් මත ගොඩනැගිල්ල ඉදිකිරීම අතරමග නතරවුවහොත් හෝ අලෙවි සැල ආරම්භ කිරීමෙන් පසු එහි කටයුතු ඉහත කී හේතුවක් මත අතරමග නතරවුවහොත් එහි සම්පූර්ණ වගකීම දෙවන පාර්ශවය සතුවන අතර ඒ අනුව රජය විසින් වැය කරන ලද මුදල 10%ක පොළියක් ද සහිතව ගෙවිය යුතු ණය මුදලක් බවට පත්වෙන අතර එම සම්පූර්ණ ණය මුදල පොළිය ද සහිතව ආපසු රජය වෙත ගෙවීමට බැඳී සිටින බවට දෙවන පාර්ශවය එකඟ වේ.

4.3 පාර්ශවයන්ට පාලනය කළ නොහැකි ස්වාභාවික හේතුවක් මත හෝ දෙවන පාර්ශවය විසින් චේතනාන්විතව සිදු නොකරන ලද යම් හේතුවක් මත හෝ ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාම අතරමග නතරකිරීමට සිදුවුවහොත් එහි වගකීමෙන් පළමු පාර්ශවය නිදහස් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ මූලිකත්වයෙන් සිදුකරන ස්වාධීන පරීක්ෂණයක් මගින් සිදු කළ හැකි අතර එබඳු අවස්ථාවක දී පමණක් 4.2 ඡේදයේ සඳහන් වගකීමෙන් දෙවන පාර්ශවය නිදහස් වේ.

4.4 යම් හෙයකින් දෙවන පාර්ශවය සතු මෙම අලෙවිසැල සොරසතුරන්ගෙන් හානියට සහ අපදාවකට ලක් වුවහොත් අවශ්‍ය නෛතික ක්‍රියා මාර්ග ගෙන සමෘද්ධි සංවර්ධන නිලධාරි/ග්‍රාම නිලධාරී මගින් ප්‍රාදේශිය ලේකම් දැනුම්වත් කිරීම දෙවන පාර්ශවය විසින් නොපමාව සිදුකළ යුතු අතර, ඒ පිළිබදව අවසන් තිරණය ප්‍රාදේශිය ලේකම් විසින් ගනු ලබයි.

4.5 පළමු පාර්ශවයේ ලිඛිත අවසරයකින් තොරව මෙම අලෙවිසැල තෙවන පාර්ශවයකට කිසිදු ආකාරයකින් පැවරීම, බදු දීම, උකස්කිරීම හෝ විකිණීම දෙවන පාර්ශවය විසින් සිදු නොකළ යුතුය.

4.6 පළමු පාර්ශවයේ ලිඛිත අවසරයකින් තොරව මෙම ගොඩනැගිල්ලේ ව්‍යුහමය වෙනසක් සිදුකිරීම හෝ අලෙවිසැලෙහි නම හෝ තේමා පාඨය වෙනස් කිරීම හෝ දෙවන පාර්ශවය විසින් නොකළ යුතුය.

4.7 මෙම අලෙවිසැල තුළ දෙවන පාර්ශවය විසින් අඩුආදායම් ලාභීන්ගේ හා සමෘද්ධි ලාභින්ගේ නිෂ්පාදන ප්‍රතික්ෂේප කිරීමකින් තොරව අලෙවි කිරීම සිදු කළ යුතු අතර එම නිෂ්පාදන සඳහා උපරිම මිලක් නිෂ්පාදකයාට ලබා දීමත් එම නිෂ්පාදන අලෙවි කිරීමෙන් පසු දින තුනක් ඇතුළත ඒ සඳහා වන මුදල් එකී සැපයුම්කරුවන්ගේ ගිණුමට දෙවන පාර්ශවය විසින් බැරකළ යුතු අතර, එම ගණුදෙනුවලට අදාල ලදුපත් ගොනුකර තබාගත යුතුය.

4.8 මෙම අලෙවිසැලෙහි විකුණනු ලබන අත්‍යවශ්‍ය භාණ්ඩ, වසමෙහි ඇති අනෙකුත් කඩ වලට වඩා අඩු මුදලට අලෙවි කළ යුතු අතර එම භාණ්ඩවල ගුණාත්මය පවත්වාගැනීමත් භාණ්ඩ හිගයකින් තොරව පාරිභෝගිකයන් වෙත සැපයීම සඳහා ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමත් දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතුය.

4.9 අත්‍යවශ්‍ය භාණ්ඩ සතොස හා සමූපකාර අලෙවි ජාලයෙන් තොග මිලට ලබා ගැනීමේ හැකියාව දෙවන පාර්ශවය සතුවේ.

4.10 මෙම අලෙවි සැල සෑම දිනකම පෙ.ව.6.00 සිට ප.ව. 10.00 දක්වා විවෘතව තබා ගැනීමත් හදිසි අවස්ථා වලදී (ඇදිරි නීති / වසංගත තත්වයන් හා අපදා අවස්ථා වලදී) අලෙවි සැල විවෘතව තැබීමත් දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතුය.

4.11 මෙම අලෙවි සැල නීති විරෝධී කටයුතු සඳහා භාවිතා කිරීම සපුරා තහනම් වන අතර, අලෙවිසැල තුළ මත්ද්‍රව්‍ය, මත්පැන් හා දුම්වැටි අලෙවි කිරීමද සපුරා තහනම් වේ.

4.12 පරිසර හිතකාමී ලෙස හා පරිසරයට හානි නොවන පරිදි අලෙවි සැල පවත්වාගෙන යා යුතු අතර අසල් වාසීන්ට කරදර හා හිරිහැර නොවන පරිදි පවත්වාගෙන යාමද දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතුය.

4.11 රජය විසින්, දෙවන පාර්ශවය වෙත ලබාදෙනු ලබන මෙම ගෘහස්ථ අලෙවිදසැල සඳහා දෙපාර්ශවයේ එකඟත්වය මත පසුව තීරණය කරනු ලබන මාසික කුලියක් ආපසු ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටී.

ඉහත සඳහන් පොරොන්දු ගිවිසුම් කියවා තේරුම් ගෙන ඊට එකග ව පළමු පාර්ශවයට බැඳුණු **.................................. ප්‍රාදේශීය ලේකම්** සහ දෙවන පාර්ශවයට බැඳුණු **....................................................** යන අයද මෙයටත් මෙම වගන්ති හා දාතම දරණ තවත් ලියවිලි එකකටත් වර්ෂ 2021ක් වූ ...................... මස ............. වන දින ........................ දී අත්සන් තබන ලදී.

| | |
|---|---|
| **......................................** | **...........................** |
| **ප්‍රාදේශීය ලේකම් (.................)**<br>(පළමු පක්ෂය) | **.........................................**<br>**(දෙවන පක්ෂය)** |
| සාක්ෂි : | සාක්ෂි : |
| 1. අත්සන<br>නම<br>ජා.හැ.අංකය<br>ලිපිනය | 1. අත්සන<br>නම<br>ජා.හැ.අංකය<br>ලිපිනය |
| 2. අත්සන<br>නම<br>ජා.හැ.අංකය<br>ලිපිනය | 2. අත්සන<br>නම<br>ජා.හැ.අංකය<br>ලිපිනය |